
# නියරෙහි එළවළු වගාව නොහොත් නියර වගාව

කුඹුරු නියරවල එළවළු වගාව නියර වගාව ලෙස සටහන් කිරීමට පුළුවන. නියරෙහි එළවළු තෙත් කලාපයේ සුළු වශයෙන් වගා කෙරේ. ඒවා මාතර, ගාල්ල, කෑගල්ල දිස්ත්‍රික්ක වල දක්නට ලැබේ. වගා කරනු ලබන බෝග ලෙස මෑ, බණ්ඩක්කා ප්‍රධාන තැනක් ගනී.

මාතර දිස්ත්‍රික්කයේ විල්පිට ප්‍රදේශය කෙරෙහි ප්‍රධාන අවධානය යොමු කර මෙහි ක්‍රියාකාරකම්, වාසි-අවාසි සහ වැදගත්කම සටහන් කිරීමට උත්සාහයක් ගනු ලැබේ.

කුඹුරේ අස්වැන්න නෙළීමෙන් පසුව, ප්‍රථම බිම් සකස් කිරීමේදී හෝ ඊට ප්‍රථම නියරවල මඩ තියා සකසා ගන්න. අස්වැන්න නෙළා සති 03 ක් ඉක්ම යාමට පෙර මෙය කිරීමට සටහන් කර ගන්න. ඊට පසු බෝගයේ අවශ්‍යතාවය අනුව නියර සකස් කර බීජ, ක්ෂේත්‍රයේ සිටුවිය යුතුය. වගා කිරීමට ගන්නා බෝගයේ වයස, වී බෝගයේ වයසට සමාන හෝ අඩු හෝ විය යුතුය. එළවළු බෝගය කලින් වගා කිරීම මගින් වී බෝගය කිරට නැවෙනවාත් සමඟම නියර වගාවෙන් ලැබෙන අස්වැන්න ලබාගෙන අවසන් කළ යුතුය. එවිට නියර වගාවේ එළවළු බෝග හානි කිරීමට එන කුරුල්ලන්ගෙන් වී වගාවට වන හානිය අඩුකර ගැනීමට හැකි වේ.



ඡායාරූපය 1 නියර වගාව : තනි පේළියට සිටුවා ඇති දින 40 ක පමණ මෑ බෝගය. වී වැපිරීම සඳහා [illegible] කර ඇත.

## වගා කරන බෝග සහ වගා ආකාරය:-

මහ කන්නය සඳහා ඉන්නල වගා කල හැකිය. යල සහ මහ කන්න් වලදී මෑ, බණ්ඩක්කා, වැටකොළු රාබු ආදිය සාර්ථක ලෙස වැවීමට පුළුවන. වම්බොටු මඤ්ඤොක්කා, බතල, නිවිති වැනි බෝග ද ගොවීන් විසින් වගා කරනු ලබයි. සාර්ථක ඵලදාවක් මහ කන්නයේදී යල කන්නයට වඩා නෙලා ගත හැකි බව ගොවීහු අත්දැකීමෙන් දනිති.

වගා කටයුතු කරන නියරෙහි පළල අඩි 1 1/2 සිට 3 ත් උස අඩි 1 සිට 1 1/2 ත් අතර වෙයි. නියරෙහි පළල අනුව සහ බෝග වර්ගය අනුව බෝග තනි පේළියට හෝ පේළි දෙකකට දැමිය හැකිය. (ඡායාරූපය 1, 2) බණ්ඩක්කා බොහෝ විට තනි පේළියට වගා කිරීම සුදුසුය. (ඡායාරූපය 3) නියර මැදින් හෝ පැත්තෙන් යාමට ඉඩ සලසා වගාව කළ යුතුය. ආලෝකය, ඉඩ සහ ජලය අවශ්‍ය ප්‍රමාණයට ඇති නිසා තනි බෝග සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශිත පරතරයට අඩු පරතරයක් සහ වැඩි පොහොර ප්‍රමාණයක් අනුගමනය කිරීම වැඩි අස්වැන්නක් ලබා ගැනීමට හේතුවිය හැක. අනෙකුත් සියළුම බෝග වගා කටයුතු සඳහා නිර්දේශිත උපදෙස් අනුගමනය කළ යුතුය.

පහත සඳහන් වාසි මෙම නියර වගාව නිසා ගොවියාට ලැබේ.

නියර හොඳින් සැකසීම නිසා නියර ශක්තිමත් වීම මගින් කුඹුරෙහි පහසුවෙන් ජලය රඳවා ගත හැකිවෙයි. අධික වර්ෂා වලදී නියරවල් කඩාගෙන නොයයි. එමගින් වී වගාවට යහපත් ප්‍රතිඵල ගෙන දෙයි. නියර ශක්තිමත් වීම මගින් නියර තුළ ගමන් කරන්නාට නියර තුළ එරීමකට භාජනය නොවීමත්, නියර කැඩීමකට භාජනය නොවී ගමන් කිරීමේ හැකියාවත් ලැබෙයි.

නියරෙහි හොඳින් නඩත්තු වන වගාවක් තිබෙන නිසා වල් පැල වලින් අඩු නියරක් පවත්වා ගත හැකි වෙයි. විවිධ පළිබෝධ වලට කුඹුර තුළ ජීවත් වීමට ඇති ධාරක වල් පැල අඩුවෙයි.



ඡායාරූපය 2 නියර වගාව : පේළි දෙකට සිටුවා ඇති අස්වැන්න නෙලන තත්ත්වයේ තිබෙන මෑ වගාවක්. [illegible] සලසා ඇත. වී බෝගය සංස්ථාපනය කර ඇත.

වී වගාවෙන් ආදායම නොලබන කාලයේදී අමතර ආදායමක් ලබා ගැනීමට හැකි වේ.

වී වගාවේ ප්‍රධාන පළිබෝධ වලින් එලවළු වගාවට හෝ එලවළු වගාවේ ප්‍රධාන පළිබෝධ වී වගාවට හෝ හානි කිරීම බොහෝ දුරට අඩු වේ.

නියර වගාවේදී එලවළු බෝගයට හොඳාකාරව හිරුඑළිය, ජලය සහ ඉඩකඩ ලැබීම නිසා එලවළු වගාව සාර්ථකව කරගෙන යාමට හැකිවේ.

නියර වගාවේදී ගොවියාට මුහුණ පෑමට සිදුවන අවාසි කිහිපයක් ද වේ.

නියරෙහි යාමට සුළු අපහසුවක් සමහර විට ඇතිවිය හැකිය.

නියර ශක්තිමත් ව සාදන නිසා ඒ සඳහා කුඹුරෙන් ඉඩ ප්‍රමාණයක් වෙන් වෙයි.

## නිගමනය :-

නෙත් කලාපයේ බොහෝ කුඹුරුවල බාධාවකින් තොරව නියරවල සාර්ථකව එළවළු වගා කල හැකිය. මෙමගින් සැලකිය යුතු අමතර ආදායමක්, වී වලින් ආදායමක් නොලැබෙන කාලයට ලබා ගත හැකිය. නියර සාර්ථකව සකස් කරන නිසා වී වල අස්වැන්න ද වැඩිවීමට ඉවහල් වෙයි.



ඡායාරූපය 3  නියර වගාව : තනි පේළියට සිටුවා ඇති බණ්ඩක්කා වගාවක්. වී බෝගය සංස්ථාපනය කර ඇත.


**කේ. කේ. පෙරේරා**

පර්යේෂණ නිළධාරි

කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය

තෙලිජ්ජවිල.


---

# "ගොවි ජනතා"

**කලාපයක මිල : රු. 15.00 යි.**

"ගොවි ජනතා" සඟරාව සම්බන්ධයෙන් ඔබ දක්වන අදහස් හා ප්‍රතිචාර අපි ඉතා අගය කොට සලකමු. එසේම ඒවා ඉදිරි කලාපයන්හි පල කිරීමටද කටයුතු කෙරේ. එමනිසා, එකී දෑ, සංස්කාරක වෙත දන්වා එවන ලෙසට පාඨක ඔබට ආරාධනා කරමු.


සංස්කාරක

"ගොවි ජනතා"

ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

තැ. පෙ. 1522,

කොළඹ.